FORB Learning Platform

# Script: The contents of Freedom of Religion or Belief – protection from coercion
# ආගම ඇදහීමේ සහ විශ්වාසයන් දැරීමට ඇති නිදහසට ඇතුලත් වන දෑ - බලහත්කාරයට ලක්වීමෙන් ආරක්ෂා වීම

බලහත්කාරයට ලක්වීමෙන් ආරක්ෂා වීමට ඇති අයිතිය, ආග

ම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසේ වැදගත් පැතිකඩක් වනවා. යමෙකු ඔබට යමක් කිරීමට බල කිරීම හෝ බිය ගැන්වීම බලහත්කාරය යනුවෙන් හඳුන්වනවා.

සෑම කෙනෙකුටම තම ආගම හෝ විශ්වාසය තබාගැනීමට හෝ වෙනස් කිරීමට අයිතියක් ඇති බව ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසේ මූලික පැතිකඩක් වනවා. ආගම හෝ විශ්වාස සහ ඒවා ප්‍රකාශකිරීම සිදුකරන්නේ ස්වේච්ඡාවෙන් යැයි පැවසීම, මෙය පිළිබඳව සඳහන් කල හැකි තවත් ආකාරයක් වනවා.

මෙම අයිතිය මගින් බලහත්කාරයෙන් ආරක්ෂා වීම පිළිබඳව විස්තර කරනවා. තමන්ගේ විශ්වාසයන් හෝ ක්‍රියාවන් අන් අය මත බලෙන් පැටවීමට රජයට, ආගමික නායකයින්ට හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමක කිසිවෙකුට අයිතියක් නැහැ. ඒවාගේම ඔවුන්ගේ ආගම හෝ විශ්වාසය තබාගැනීමට, පවත්වාගෙන යාමට හෝ වෙනස්කරන්නට බලකරන්නටත් බැහැ

*<u>සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 18 වන වගන්තිය 2 වන ඡේදය</u>*

*ණීකිසිවකුත් බලහත්කාරයට යටත් නොවී සිටිය යුතු අතර එසේ වුවහොත් එය ඔහුගේ තේරීමට අනුව ආගමක් හෝ විශ්වාසයක්  පිළිගැනීමට ඔහුට ඇති නිදහස අඩාල වීමක් වේ.*□

මෙම පැතිකඩ මගින් මිනිසුන්ට බලහත්කාරයෙන් බලපෑම් කිරීම නතර කිරීම පමණක් නොව, සමාජයේ වෙනත් පුද්ගලයින්ගෙන් හෝ කණ්ඩායම් නිසා මුහුණ දෙන තර්ජන හෝ ප්‍රචණ්ඩත්වයෙන් ජනතාව ආරක්ෂා කිරීමේ රාජකාරියක් ද රාජ්‍යයන්ට පවරනවා.

මීට අමතරව තර්ජන, ප්‍රචණ්ඩත්වය හෝ දඩ හෝ සිරදඬුවම් ලෙස අපට බලහත්කාරය සම්බන්ධයෙන් උදාහරණ ලෝකය පුරාම  පේන්න තියනවා.  ආගම් මාරු කිරීමට හිලව්‍ වශයෙන් රැකියා ලබා දීම හෝ ආගමක් හෝ විශ්වාසයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කළහොත් සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා මිනිසුන්ගේ ප්‍රවේශය නැවැත්වීම වැනි වඩාත් සියුම් ආකාර වලින් ද බලහත්කාරය ක්‍රියාත්මක වෙනවා.

සමහර විට රාජ්‍යයන් ද එක්කෝ නිල වශයෙන් නීති සම්පාදනය කිරීම හරහා හෝ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ ක්‍රියා මාර්ගයෙන් බලහත්කාර කිරීමට සම්බන්ධ වනවා.

බහායි ප්‍රජාව ඉරානයේ  සිටින විශාලතම මුස්ලිම් නොවන ආගමික සුළුතරයයි. 1979 විප්ලවයේ සිට බහායිවරුන්ට ඉස්ලාම් ආගමට හැරීමට බලකිරීමේ උත්සාහයක් ලෙස රජයේ ප්‍රතිපත්තියක් ලෙස ක්‍රමානුකූලව පීඩා කරනු ලැබුවා. විප්ලවය සිදුවී වසර 10 තුළ බහායිවරු 200 කට වැඩි පිරිසක් ඝාතනයට ලක් වූ අතර, සිය ගණනකට වධහිංසා  පැමිණවීම හෝ සිරගත කිරීම සිදු කිරීම සහ දස දහස් ගණනකට රැකියා අහිමිවීම, අධ්‍යාපනය සහ වෙනත් අයිතිවාසිකම් අහිමි වූයේ ඔවුන්ගේ ආගමික විශ්වාසය නිසා යි.

2017 දෙසැම්බර් වන විට ඉරානයේ බහායි සිරකරුවන් 97 ක් සිටියා , ජාතික මට්ටමේ බහායි නායකයින් හය දෙනෙක් ද ඒ අතර සිටියා.

මෙම උදාහරණයෙන් වෙනස්කොට සැලකීම සහ බලහත්කාරය අතර ඇති සම්බන්ධය පැහැදිලි කෙරෙනවා. ඉරානයේ බහායිවරුන්ට විශ්ව විද්‍යාලයට යාම හා සිවිල් සේවයේ රැකියා කිරීම තහනම් වනවා. මෙම වෙනස්කොට සැලකීමේ නීතිය බලහත්කාරයෙන් ක්‍රියාත්මක වෙනවා. ශිෂ්‍යයෙකු හෝ සේවකයෙකු බහායි බව අනාවරණය වූ විට ඔවුන්ට ඉස්ලාම් ආගමට හැරීම හෝ ඔවුන්ගේ තනතුර අහිමි වීම යන තේරීම් දෙකෙන් එකකට මුහුණ දීමට සිදු වෙනවා.

සමහර අවස්ථාවලදී ප්‍රචණ්ඩ ජාතිකවාදී හෝ අන්තවාදී කණ්ඩායම් තම ආගම හෝ විශ්වාසයන් වෙනස් කිරීමට මිනිසුන්ට බල කරනවා. ඊනියා ඉස්ලාමීය රාජ්‍යය වන ඩාඑෂ් විසින් යෙසිඩිවරුන්ට හා කිතුනුවන්ට ආගම් මාරු කිරීමට බල කළ අතර ප්‍රතික්ෂේප කරන පුද්ගලයින් ඝාතනය කරනු ලැබුවා. ඉන්දියාවේ, හින්දු ජාතිකවාදීන් විසින් සිදු කරන ලද ජාතිවාදි ප්‍රචණ්ඩ ක්‍රියා වලදී සිදු කරන ලද හින්දු ආගමට බලහත්කාරයෙන් හැරවීම් ලේඛනගත කර තිබෙනවා. මියන්මාරයේ දී, හමුදාව විසින් කිතුනුවන්ට ඔවුන්ගේ අතහැරීමට හා බුද්ධාගමට හැරවීමට තුවක්කු පෙන්වා බල කළ බවට වාර්තා වී තිබෙනවා. මධ්‍යම අප්‍රිකානු ජනරජයේ සමහර ප්‍රදේශවල මුස්ලිම්වරුන්ට ක්‍රිස්තියානි ආගමට හැරෙන්නේ නැත්නම් වෙඩි තබන බවට තර්ජනය කර තිබෙනවා.

බලහත්කාරය තහනම් කිරීම මගින් මිනිසුන්ට ඔවුන්ගේ ආගම ඇදහීමේ සහ විශ්වාසයන් දැරීමත්, සම්මත කිරීමට හෝ වෙනස් කිරීමට හැකි වෙනවා, බොහෝ පුද්ගලයන් ආගමේ භාවිතයට අදාළව රාජ්‍ය හා සමාජීය බලහත්කාරය අත්විඳිනවා. මෙම බලහත්කාරය විදහා දක්වන එක් ගැටළුවක් වන්නේ කාන්තාවන්ගේ ඇඳුම්. සමහර රටවල් කාන්තාවන්ට ආගමික ඇඳුම් ඇඳීම නීත්‍යානුකූලව නියම කරන අතර තවත් රටවල් කාන්තාවන් එසේ කිරීම තහනම් කර තිබෙනවා. කාන්තාවන් ආගමික ඇඳුම් ඇඳගෙන සිටිනවා නම් ඔවුන්ගේ ආගමික ප්‍රජාවෙන් පිටත සිටින පුද්ගලයින්ට හිරිහැරවලට මුහුණ දීමට සිදු වන අතර නොඇඳ සිටින විට ඔවුන්ගේ ආගමික ප්‍රජාවෙන් හිරිහැර වලට මුහුණ දීමට සිදු වෙනවා.

බලහත්කාරය මගින් විවිධ පුද්ගලයින්ට බලපෑම් කළ හැකියි. බොහෝ රටවල, රාජ්‍ය දෘෂ්ටිවාදයෙන් හෝ සමාජ සම්මතයෙන් වෙනස් ආගමික අදහස් හෝ භාවිතයන් අනුගමනය කරන පුද්ගලයින් බලහත්කාරය මගින් පීඩාවට පත් වනවා. සුලු ජාතීන්, අදේවවාදීන්, ආගමට හරවා ගත් අය හෝ 'විදේශීය' යැයි සලකන ආගම් ඇති පුද්ගලයින් ට මෙය බොහෝ විට බලපානවා. මීටත් අමතරව ආගමික කණ්ඩායම් තුළ ද, මිථ්‍යාදෘෂ්ටිකයන්, අපහාස කරන්නන් හෝ තම ආගම නිසි ලෙස පිළිපැදීමට අපොහොසත් යැයි සැලකෙන පුද්ගලයින්ට ඔවුන්ගේ විශ්වාසයන් වෙනස් කිරීමට රජය, ඔවුන් ගේ පවුල් හෝ සමාජය මගින් බලහත්කාරයෙන් බලපෑම් කළ හැකියි.

සාරාංශයක් ලෙස, බලහත්කාරයට තර්ජන, ප්‍රචණ්ඩත්වය, වෙනස් කොට සැලකීම හෝ දඩ නියම කිරීම හෝ සිර දඬුවම් වැනි දෑ ඇතුළත් විය හැකි අතර, රාජ්‍යයෙන් හෝ ප්‍රජාවේ පුද්ගලයින්ගෙන් සහ කණ්ඩායම් අතින් බලහත්කාරය සිදුවිය හැකියි. කිසිවෙකු බලහත්කාරයට යටත් නොවිය යුතු බව කීමෙන්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මිනිසුන්ට බලහත්කාරයෙන් බලපෑම් කිරීම පමණක් නොව, සමාජයේ බලහත්කාරය වැළැක්වීම සහ නැවැත්වීම සඳහා කාර්‍යක්ෂමව ක්‍රියා කිරීමෙන් ජනතාව ආරක්ෂා කිරීමේ රාජකාරියක් ද රාජ්‍යයන්ට පවරනවා.

බලහත්කාරයෙන් ආරක්ෂා වීම පිළිබඳ වැඩි විස්තර, ඒ පිලිබඳව සඳහන් කරන මානව හිමිකම් ලියකියවිලි ඇතුළු පුහුණු ද්‍රව්‍ය ඔබට වෙබ් අඩවියෙන් සොයාගත හැකිවේවි.

Copyright: SMC 2018